සාමාන්‍ය සමය තිස්හතරවන හෙවත් අවසාන ඉරුදින **දේව ප්‍රකාශන** 25-11-12

ක්‍රිස්තු රාජ මංගලෝත්සවය

## පළමුවන කියැවීම

දනියෙල් 7:13-14

දනියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"උන් වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති නොවන්නේ ය."**

"තවදුරටත් බලා සිටිය දී මම රාත්‍රී දර්ශනවල දී මෙසේ දිටිමි. මනුෂ්‍ය-පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේ ය. උන් වහන්සේ පෞරාණිකයාණන් වෙත පමුණුවනු ලැබූ සේක. සියලු ජනයන් ද ජාතීන් ද භාෂාවන් ද උන් වහන්සේට සේවය කරන පිණිස පාලන බලය ද ගෞරවය ද රාජ්‍යය ද උන් වහන්සේට දෙන ලද්දේ ය. උන් වහන්සේගේ පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන් වහන්සේගේ රාජ්‍යය කිසි කලෙක නැති නොවන්නේ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 93:1-2, 5

පිළිතුර: සමිඳුණෝ මහිමාලංකාරයෙන් සැරසී සිටින රජාණෝය.

ගීය: සමිඳුණෝ රජකම් කරන සේක. ජයශ්‍රීය නමැති ඉඟ පටිය බැඳ මහිමාලංකාරයෙන් සැරසී සිටින සේක. සදහට ම නොසැළෙන සක්වළ පිහිටවූ සේක.

ඔබේ සිහසුන ආදියේ පටන් තිරසාර ව පිහිටා ඇත්තේ ය. ඔබ අනාදියේ පටන් වැඩ සිටින සේක.

සමිඳුනි, ඔබේ අන පනත් සදාතනික ය. ඔබේ දේව මාලිගාව සැබවින් ම සදහට ම සුවිශුද්ධ ය.

## දෙවන කියැවීම

එළිදරව්ව 1:5-8

එළිදරව්ව පොතෙන් ගත් කොටසකි.

**"උන් වහන්සේ අප රාජකීය, පූජක වංශයක් කළ සේක."**

මළවුන් ගෙන් උත්ථාන වූ කුළුඳුලාත්, මිහි පිට රජුන්ගේ අධිපතියාත් වන, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ද, ඔබට කරුණාව හා ශාන්තිය වේවා! උන් වහන්සේ අපට ප්‍රේම කරන සේක. සිය දිවි පිදීමෙන් අප පවින් මිදූ සේක. තම පියාණන් වන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස උන් වහන්සේ අප රාජකීය, පූජක වංශයක් කළ සේක. ඒ තැනැත් වහන්සේට, මහිමය ද බලපරාක්‍රමය ද සදහට ම වේවා! ආමෙන්. බලන්න, උන් වහන්සේ වලාකුළු පිරිවරා වඩින සේක. සියල්ලෝ උන්

වහන්සේ දකින්නෝ ය. කුරුසියේ ඇණ ගැසූ අයද උන් වහන්සේ දකින්නෝ ය. මිහි පිට සියලු ජාතීහු උන් වහන්සේ නිසා වැළපෙන්නෝ ය. එය සැබෑ ම ය. ආමෙන්. "ආරම්භය ද අවසානය ද මම වෙමි"යි වැඩ සිටින, වැඩ සිටිය, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමින් වන දෙවියන් වහන්සේ වදාරන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

මාක් 11:9-10

**ආලේලූයා! ආලේලූයා!**
**අපේ පිය වූ දාවිත්ගේ මතු පැමිණෙන රාජ්‍යයට ආසිරි වේ වා!**
**සමිඳුන් නමින් වඩිනා මෙතුමාණන් හට ආසිරි වේ වා!**
**අති උසස් තැන්හි හෝසන්නා!**
**ආලේලූයා!**

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 18:33-37

සුවිශේෂක ජුවාම් තුමා විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මම රජෙක් යයි ඔබම කියන්නෙහිය."**

එබැවින් යළිත් රජවාසලට පිලාත් ඇතුළු වී, ජේසුස් වහන්සේ කැඳවා, "නුඹ ජුදෙව්වරුන්ගේ රජද" යි ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මෙය ඔබම කියන දෙයක් ද, නැතහොත් අන් අය මා ගැන කී දෙයක්ද"යි ඇසූ සේක. පිලාත් පිළිතුරු දෙමින්, "මම ජුදෙව්වෙක් ද? නුඹේ ම ජාතිය ද නායක පූජකයෝ ද නුඹ මා අතට භාර දුන්හ. නුඹ කුමක් කෙළෙහි ද?" යි ඇසීය. ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින්, "මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති නැත. මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති වුවක් නම්, ජුදෙව්වරුන් අතට මා භාර නොදෙන පිණිස මාගේ සේවකයන් සටන් කරනු ඇත. ඒ නිසා මාගේ රාජ්‍යය මෙලොවින් වුවක් නොවේය" යි වදාළ සේක. එවිට පිලාත්, "එසේ නම්, නුඹ රජෙක්ද"යි උන් වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මම රජෙක් යයි ඔබම කියන්නෙහිය. මා උපන්නේත්, ලොව පහළ වුයේත් සත්‍යයට සාක්ෂි දරන පිණිස ය. සත්‍යයෙහි පිහිටි සියල්ලෝ මාගේ හඬ අසති"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.